දරුවන් උදෙසා
බයිබලයක්

# ජේසුස් වහන්සේ සහ සාකෙවුස්



ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Janie Forest
Alastair Paterson

සකස්කරන්නා: Ruth Klassen

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2023 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.



එක් දිනක්
ජේසුස් වහන්සේ
ජෙරිකෝව මැදින්
ගමන් කළ සේක.
මෙ◌්, බොහෝ
කලකට පෙර
ජෝෂුවා විසින්
විනාශ කළ නගරය
විය. දැන් එය නැවත
ගොඩනඟා ඇති
අතර බොහෝ
මිනිස්සු එහි වාසය
කළෝය. ඔවුන්
අතර සාකෙවුස්
නම් මිනිසෙක්
වූයේය.



ඇතැම් විට ජෙරිකෝවේ අනෙක් මිනිසුන් සාකෙවුස්ට එතරම් කැමති නොවූයේ ඔහු ඔවුන්ගෙන් බදු මුදල් එකතු කළ බැවිනි. සාකෙවුස් මුදල් වලින් කොටසක් රජයට යැව්වද තමුන් වෙනුවෙන් වැඩි කොටසක් තබා ගත්තේය.

බදු එකතු කරන්නෙකු වීම නිසා සාකෙවුස් ඉතා පොහොසත් වූයේය. ඔහුගේ නිවස, සියලු නිවෙස් අතර විශාලතම සහ හොඳම නිවස වූවා විය හැකිය.



නමුත් ඔහු ඉතා මිටි
වූයේය - මුදලින් අඩුවක්
නොව උසින් අඩු වීමකි.
සාකෙවුස් කවදාවත්
අනෙක් මිනිසුන් තරම්
උසින් වැඩුණේ නැත.





ජේසුස් වහන්සේ යෙරිකෝවේ සිටින බව ඇසූ සාකෙවුස් නම්
මිටි බදු එකතු කරන්නාට දෙවියන් වහන්සේගේ පුත්‍රයා
යැයි කියාගන්නා නාසරෙත්හි මිනිසා දැකීමට අවශ්‍ය
විය. නමුත් සෙනග බොහෝය. ඔවුන් උසින්ද වැඩිය.



සාකෙවුස්ට අදහසක් හිතට ආවේය! සෙනඟට වඩා උස තැනකට යාහැකි වේනම්... මාර්ගය හොඳින් පෙනෙන පිණිස ගහකට නැග ගත හැකි වේනම්. ඔහුට ජේසුස් වහන්සේ දකින්නට පුළුවන් වනු ඇත.



අත්තික්කා ගසකට
නැඟගත්, සාකෙවුස් අතු
අතර සුවපහසු දෙබලක්
සොයාගෙන ජේසුස්
වහන්සේ එනතුරු බලා
සිටියේය. “මට දැන් හොදින්
පෙනේවි” යි ඔහු සිතන්නට
ඇත. “කිසිවෙකුට නොපෙනී
හිදිමින් දැන් මට
උන්වහන්සේව
දකින්නට පුළුවන”.

“සාකෙවුස්, ඉක්මන් කර
බැස එන්න.” මිටි බදු එකතු
කරන්නාට ඔහුගේ කන්
අදහා ගත නොහැකි විය.
ජේසුස් වහන්සේ ගස යට
සිටගෙන සිටි සේක. ජේසුස්
වහන්සේ ඔහු දෙස බලා
සිටි සේක. ජේසුස්
වහන්සේ ඔහුට
කතා කළ සේක!





ජේසුස් වහන්සේ තමුන්ට
කතා කරනු අසා සකෙවුස්
විමතියට පත් වූයේය. “අද
මම ඔබේ නිවසේ සිටිය
යුතුයැ” යි ජේසුස් වහන්සේ
පැවසූ විට ඔහු පුදුමයට පත්
වන්නට ඇත. සාකෙවුස්
ගසෙන් ඉක්මනින් බිමට
බැස්සේය. ඇතැම්විට
ඔහු වැටෙන්නට පවා
ආසන්න වූවා විය හැක.

ජේසුස් වහන්සේ තම නිවසට පැමිණීම ගැන සාකෙවුස් සතුටු වූයේය. නමුත් ජනතාව ඊට කැමති නොවූවෝය. සාකෙවුස් වැනි පව්කාරයෙකු බැලීමට ජේසුස් වහන්සේ නොයා යුතුයැයි ඔවුහු මැසිවිලි නැඟූහ.







ජේසුස් වහන්සේ
සකෙවුස්ට අලුත්
ජීවිතයක් ගෙනදුන්
සේක. “ස්වාමීනි, මම
මාගේ වස්තුවෙන්
බාගයක් දුප්පතුන්ට
දෙන්නෙමි, මම
යමෙකුට වංචා කර
ඇත්නම්, එය මෙන්
හතර ගුණයක්
ආපසු දෙන්නෙමි.”

සාකෙවුස්ගේ අලුත්
ජීවිතය ගැන ජේසුස්
වහන්සේ සතුටු වූ සේක.
මිනිසුන් පාපයෙන් හැරී,
නිවැරදි දේ කරනවා
දකින්න උන්වහන්සේ
කැමති වන සේක.
“මනුෂ්‍ය පුත්‍රයා
පැමිණියේ නැතිවූ දේ
සෙවීමට සහ ගළවා
ගැනීමටයැ” යි ජේසුස්
වහන්සේ කීසේක. එදා
ජෙරිකෝවේදී යේසුස්
වහන්සේ සාකෙවුස්ව
සොයාගත් සේක!



ජේසුස් වහන්සේ සහ සාකෙවුස්

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

ශු. ලූක් 19

**"ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ"**
**ගීතාවලිය 119:130**

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහෝ සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැඟිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)